

ශ්‍රී ලංකාවේ පෞද්ගලික බැංකු අතර ප්‍රමුඛතම වාණිජ බැංකුවක් ලෙසින් විරුදාවලි ලත් HNB අපි, අපගේ දැක්ම සහ අධිෂ්ඨානය පෙරදැරිව ව්‍යාපාර මානයෙන් ඔබ්බට ගිය බැංකුකරණයක නිරත වෙමින් ගම් දනව්වල සිට විශ්වීය බැංකුකරණ අත්දැකීම් දක්වා මෙරට බැංකුකරණය විහිදුවා ඇත. මේ සා විශාල හැකියාවන් රැසක් සමඟ අපේ බැංකුව ඉහළින්ම වැජඹෙන්නේ අප සතු දක්ෂතා පිරිපුන් කණ්ඩායමේ ශක්තිය හේතුකොට ගෙනයි. අපේ ගමනට ශක්තියක් වී ඇත්තේ එකිනෙක බැඳුනු අපගේ ජීවනාලිය වූ සේවක බලයයි. එකම පවුලක් මෙන් එකම අදිටනින් කැපවීමෙන් අප යන මේ ගමනේ අනාගත වංශකතාව ලියන්නට උත්සාහවන්ත ඔබටත් එක්වන්න කෙරෙන ආරාධනාවයි මේ

# බැංකුකරණය සතුටුදායක අත්දැකීමක් බවට පත්කළ හැකි උද්යෝගිමත් ඔබටයි මේ අවස්ථාව

## ක්ෂුද්‍ර මූල්‍ය සහකාර

HNB ගැමි පුබුදුව වැඩසටහන යටතේ ක්ෂුද්‍ර ව්‍යාපාර විශාල ප්‍රමාණයක් සඳහා මූල්‍ය පහසුකම් සපයා ඇති අතර රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් ඇති කිරීමටද දායක වී ඇත. මෙම ක්‍රියාවලිය තව දුරටත් ව්‍යාප්ත කරමින් ක්ෂුද්‍ර මූල්‍ය සහකාරවරයෙකු වශයෙන් ග්‍රාමීය ජනතාවට සමීපව ඔවුන්ගේ ජීවිත නගාසිටුවීමට ජවසම්පන්න තරුණ ඔබගේ සහය අවශ්‍යව ඇත.

### රැකියාවේ වගකීම

මෙම ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනේ අභිලාෂය වන්නේ බැංකු සේවාවන් ග්‍රාමීය නිවාස දොරකඩටම රැගෙන යාමයි. එහිදී ඔබ, බැංකුව සහ එම ජනතාව අතර අතරමැදියෙකු වශයෙන් කටයුතු කළ යුතු වේ.
තෝරා ගන්නා අයවලුන් උසස් ආචාර ධර්ම වලට අනුගතව ග්‍රාමීය ප්‍රජාවේ විශ්වාසය දිනාගනිමින් බැංකුවේ ප්‍රතිරූපය වර්ධනය කළයුතු වේ.

### සුදුසුකම්

- අ.පො.ස. උසස් පෙළ අවම වශයෙන් විෂයන් තුනක් සමත්වීම.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව අවම වශයෙන් විෂයන් පහකට සම්මාන සාමාර්ථ ලබා තිබීම.
- පිළිගත් ආයතනයක් මගින් ලබා ගත් පූර්ණ හෝ අර්ධ කාලීන අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් අමතරව සලකා බැලෙයි.

### වයස

- අවුරුදු 18 සහ 25 අතර විය යුතුය.

### යෝග්‍යතා සහ කුසලතා

- දුරස්ථ ප්‍රදේශවල බැංකු ශාඛා සහ ක්ෂේත්‍ර තුළ කාර්ය කිරීමට කැපවීම.
- අවම අධීක්ෂණයක් යටතේ ස්වාධීනව කටයුතු කිරීමට ඇති හැකියාව.
- සාමාන්‍ය තොරතුරු තාක්ෂණ සහ පරිගණක දැනුම.
- මිනිස් සම්බන්ධතා ගොඩ නඟා ගැනීමට සහ පාරිභෝගික සේවා සැපයීමට ඇති හැකියාව.
- ග්‍රාමීය ප්‍රජාව සමග මනාව සන්නිවේදනය කිරීමට ඇති හැකියාව.
- ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් පිළිබඳ අත්දැකීම් අමතර සුදුසුකම් වේ.

**යතුරුපැදි පැදවීමේ රියදුරු බලපත්‍රය තිබීම අනිවාර්ය වේ.**

### වගකීම්

ගැමි පුබුදුව වැඩසටහන යටතේ ඔබ වෙත ලබාදෙන ඉලක්ක සපුරාලීම සහ තමන් අයත් ක්ෂුද්‍ර මූල්‍ය ඒකකයේ ලාභ ලැබීමට ඇති හැකියාව තර කිරීම.

මෙයට අමතරව පහත වගකීම් සපුරාලිය යුතුය:

- නව සේවායෝජකයන් හඳුනා ගැනීම,
- ණය ශක්‍යතාවය අධ්‍යනය කිරීම
- සේවා යෝජකයා විසින් කරන මූල්‍ය භාවිතය නිසියාකාරව සිදු කරවීම
- අදාල ව්‍යාපෘති අධීක්ෂණය සහ නියාමනය කිරීම
- ආයෝජන තත්ත්ව නියාමනය
- ගනුදෙනුකරුවන් සමග මනා සම්බන්ධතා පවත්වා ගැනීම
- සමාජයේ ක්‍රියාකාරකම් සඳහා සහභාගීවීම සහ සංවිධානය කිරීම
- අන්තර් විකුණුම් අවස්ථා හඳුනා ගැනීම සහ ප්‍රවර්ධනය.

**APPLY VIA XPRESSJOBS**

HNB

*කොන්දේසි සහිතයි. ෆිච් රේටිං: A(lka) හැටන් නැෂනල් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන වාණිජ බැංකුවකි. Hatton National Bank PLC - PQ 82